පමණක් පදනමව 2017/11/30 දින සිට 2019/05/30 දක්වා අඛණ්ඩව සේවා දිගු 03 ක් ලබා දෙමින් එම සේවකයින් සඳහා රු.මි. 3.26 ක් හෝ ඊට ආසන්න වටිනාකමක මුදලක් වැටුප්, අතිකාල හා අනෙකුත් දීමනා වශයෙන් ගෙවීමට ආධාර අනුබල ලබාදීම තුලින් ආයතන සංග්‍රහයෙහි II කාණ්ඩයේ 48 වන පරිච්ඡේදයේ පලමුවන උපලේඛනයේ අංක 07, 09, 10, 16 යන වරදිවල් සිදුකර ඇති හිටපු පරිපාලන නිලධාරි N.W.C. කුඩාහෙට්ටි (M15385) මහතාට විරුද්ධව නිතිමය ක්‍රියාමාර්ග ගැනිම සුදුසු යැයි යෝජනා කරමි.

9.5 ඉහත නිරීක්ෂණ අංක 8.11 හි දැක්වෙන ආරක්ෂක සේවකයින් 05 දෙනා සඳහා 2017 නොවැම්බර් මස සිට සේවා දිගු කිරීම් ලිපි නිකුත් කරන ලද 2019 පෙබරවාරි මස දක්වා මාස 14 ක පමණ කාලයක් සේවා දීර්ඝ කිරිමක් නොමැතිව වැටුප්/වේතන සකස් කරමින් රු. 3,267,045.62 ක් හෝ ඊට ආසන්න මුදලක් ඔවුන් වෙත ගෙවීම් කරමින් ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ 48 වන පරිච්ඡේදයේ පලමුවන උපලේඛනයේ අංක 07, 09, 10, 16 යන වරදවල් සිදුකර ඇති බැවින් හිටපු ගණකාධිකාරි (වැටුප් හා වේතන) A.N.D. ද සිල්වා (M 17149) මහත්මියට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරිම සුදුසු යැයි යෝජනා කරමි.

9.6 හිටපු අමාත්‍ය සජිත් ප්‍රේමදාස මහතාගේ පෞද්ගලික කාර්ය මණ්ඩල නිළධාරින් ලෙස කටයුතු කරමින් සිටියදී ඒ මහතාගේ දේශපාලන කාර්යන් හා බිරිඳට අයත් ව්‍යාපාරික ස්ථානයන්හි සේවයේ යොදවන ලද සංස්ථා ආරක්ෂක සේවකයින්ගේ 2018 හා 2019 වර්ෂවලට අයත් ඇතැම් බැහැර කාර්ය සටහන්පත් හා වේලා සටහන් පත් සඳහා අමාත්‍ය කාර්යාලයේ සේවය කල බවට දක්වමින් එක් එක් මාසයෙහි දිනයන් ඉදිරියෙන් සේවය ලබාගත් බවට සිය අත්සන හා නිල මුද්‍රාව තබා සහතික කරමින් සංස්ථාවට රු.මි. 42 ක් හෝ ඊට ආසන්න වටිනාකමක් සහිත මූල්‍ය අලාභයක් සිදු කිරිම සඳහා ආධාර අනුබල ලබාදී ඇති බැවින් පහත නිළධාරින්ට විරුද්ධව 1982 අංක 12 දරණ පොදු දේපල පනත යටතේ නිතිමය පියවර ගැනිම සුදුසු යැයි යෝජනා කරමි.

හිටපු නිවාස හා ඉදිකිරිම් අමාත්‍යතුමාගේ,

I. සම්බන්ධිකරණ ලේකම් - නුවන් සිරිවර්ධන

II. මාධ්‍ය ලේකම් - මහිලාල් එම් සෙනෙවිරත්න

III. සම්බන්ධිකරණ ලේකම් - ලලිත් ඩී කහපොල

IV. මහජන සම්බන්ධතා නිළධාරි
- අරුණ දහනායක

V. පෞද්ගලික ලේකම් - P. සමරසිංහ

..............................

(එන්. වී. ටී. ධම්මික)
ප්‍රධාන අභ්‍යන්තර විගණක (ආවරණ)

පිටපත් :- 01 උප සභාපති
02 සාමාන්‍යාධිකාරි